# රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් කොන්දේසි

01. ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාව තුළ පිළිගත් ආයතනවල ආපනශාලා පවත්වාගෙන යෑමේ පළපුරුද්දක් ඇති (අවම වශයෙන් ආපනශාලා පවත්වාගෙන යාම සම්බන්ධයෙන් වසර 02 ක පළපුරුද්දක් ලබා තිබිය යුතුය. මෙයින් වසර 01 ක කාලයක් විශ්වවිද්‍යාල/උසස් අධ්‍යාපන ආයතනයක ආපන ශාලාවක් සතුටුදායක අන්දමින් පවත්වා ගෙන යාම අනිවාර්යය වේ.) ටෙන්ඩර් කරුවන්ගෙන් 2024.10.23 වැනි දින ප.ව. 2.00 තෙක් ටෙන්ඩර් භාර ගනු ලැබේ. (පලපුරුද්ද සනාථ කිරීම සඳහා ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය.)

02. සියළුම ටෙන්ඩර් ඒ සඳහා නියමිත ටෙන්ඩර් පෝරම මගින් ටෙන්ඩර් පිටපත් දෙකකින් ඉදිරිපත් කළ යුතුය.

03. ආපසු නොගෙවනු ලබන රු. 3,000 /- ක ටෙන්ඩර් ගාස්තුවක් සහ ආපසු ගෙවනු ලබන රු. 5,000/- ක ටෙන්ඩර් තැන්පත් මුදලක් විශ්වවිද්‍යාලයේ සරප් වෙත ගෙවා අදාළ රිසිට්පත ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය.

04. ටෙන්ඩර් පත්‍රය පැහැදිලිව පිරිසිදුව සම්පූර්ණ කළයුතු අතර කපුගෑම මැකීම් වැනි කිසිදු වෙනස් කිරීමක් නොකළ යුතුය. නොපැහැදිලි හා සපයනු ලබන ටෙන්ඩර් කොන්දේසි වලට අනුකූල නොවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. ටෙන්ඩර්කරුවන් විසින් ඉදිරිපත් කළ යුත්තේ නියමිත ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් ආහාර සැපයිය හැකි අඩුම මිල ගණන්ය. එසේ ඉදිරිපත් කරනු ලබන මිළ ගණන් පිළිගෙන කොන්ත්‍රාත්තුව පිරිනැමූ පසු එම මිළ ගණන් වසරක කාලයක් තුල වෙනස් නොකළ යුතුය.

06. තෝරාගත් ටෙන්ඩර්කරුවන් ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා ප්‍රමාණවත් සේවක සංඛ්‍යාවක් සහ අවශ්‍ය තරම් භාණ්ඩ තමන් විසින්ම සපයා ගත යුතු අතර, එම සෑම සේවකයකු සඳහාම විශ්විද්‍යාලය මගින් හැඳුනුම්පතක් නිකුත් කරනු ලැබේ. හැඳුනුම්පත සඳහා වැය වන මුදල ටෙන්ඩර්කරු විසින් දැරිය යුතුය. කෑම පිසීම සඳහා මුළුතැන්ගෙට අවශ්‍ය භාණ්ඩ ටෙන්ඩර්කරුවන් විසින්ම ඒවා අවශ්‍ය පරිදි සපයා ගත යුතු වේ.

07. ආපනශාලාව සඳහා ජල හා විදුලි පහසුකම් විශ්වවිද්‍යාලය මගින් සපයා ඇති නමුත් ඒ සඳහා වන පිරිවැය ආපනශාලා හිමිකරු විසින් දැරිය යුතුය. (මාසික බිල්පත් ගෙවීමට කටයුතු කළ යුතුය.)

08. තෝරාගනු ලබන ටෙන්ඩර්කරු ටෙන්ඩරය පිරිනමන දින සිට වසරක කාලයක් සඳහා ස්වකිය සේවාව නිසි පරිදි විශ්වවිද්‍යාලය සම්පූර්ණ තෘප්තියට පත්වන ආකාරයට සපයනු ලබන බවට විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී සමග ගිවිසුමකට අත්සන් කළ යුතුය. ගිවිසුම අත්සන් කිරීමට පෙර විශ්වවිද්‍යාලයේ ආපනශාලාව වෙනුවෙන් ඇප මුදලක් තැන්පත් කළ යුතුය. (ආපනශාලා සඳහා තැන්පතු මුදල රු. 50,000/-) ගිවිසුම් කාලයෙන් අවසන් වූ පසු විශ්වවිද්‍යාලයේ ආපනශාලාව සඳහා තැන්පත් කල ඇප මුදල දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේඛකාධිකාරීතුමාගෙන් ලබාගත හැකිය. ගිවිසුමේ සඳහන් කොන්දේසි කඩකිරීමක් නිසා ටෙන්ඩරය අවලංගු කිරීමට සිදුවුවහොත් මෙම ඇප මුදල ආපසු ගෙවනු නොලැබේ.

09. ටෙන්ඩර් කැඳවනු ලබන්නේ භාරදුන් දින සිට වර්ෂයක කාලයක් සඳහා පමණි. එහෙත් නියමිත දින ගිවිසුම් කාලය අවසානයේදී ටෙන්ඩර්කරුවන්ගේ සේවය ඇගයීමෙන් පසු එය විශ්වවිද්‍යාලයේ අවශ්‍යතාවය පරිදි අතිරේක කාල පරිච්ඡේදයක් සඳහා දීර්ඝ කිරීමට ලේඛකාධිකාරීට බලය ඇත. තෝරාගත් ටෙන්ඩර්කරුට ආපනශාලාව පවත්වාගෙන යාම නතර කිරීම අවශ්‍ය වුවහොත් ඔහු විසින් ඒ සඳහා දෙමසකට පෙර ලිඛිතව ලේඛකාධිකාරී වෙත දැන්විය යුතුය. එසේම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ටෙන්ඩර්කරු අවශ්‍ය නොවන්නේ යැයි විශ්වවිද්‍යාලයට හැඟී යන්නේ නම් ඒ සඳහා විශ්වවිද්‍යාලය විසින් දෙමසකට පෙර ටෙන්ඩර්කරුට දන්වනු ලැබේ.

10. ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් ප්‍රාදේශීය මණ්ඩලයකට හෝ පළාත් පාලන ආයතනයකට ගෙවීමට සිදුවන ගාස්තුවක් වේ නම් ටෙන්ඩර්කරුවන් විසින් ගෙවිය යුතුය. (පනවන දඩ මුදල්)

11. 2024.10.02 වන දින සිට සාමාන්‍ය කාර්යාල වේලාවන් තුළදී දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ආපනශාලාව, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර මගින් ලංසු ලිපිලේඛණ ලබාගත හැකි අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් අනුපිටපතක් සහිතව ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් 2024.10.23 දින ප.ව. 2.00 ට පෙර ලැබෙන සේ ලංසු නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, නව ගොඩනැගිල්ලේ ආපනශාලාව, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය.

- එදින ප.ව. 2.15 ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවන් හෝ බලය ලත් නියෝජිතයෙකුට ටෙන්ඩර් විවෘත කිරීමේ දී සහභාගි විය හැක. (2024.10.23 දින ප.ව. 2.00 ට පසු ලැබෙන ටෙන්ඩර්පත් කිසිවක් භාර ගනු නොලැබේ.)

12. පහත සඳහන් කොන්දේසි යටතේ ආපනශාලාව පවත්වාගෙන යාමට ටෙන්ඩර්කරුවන් එකඟ විය යුතුය.

i. මෙම ආපනශාලාව රජරට විශ්වවිද්‍යාලයෙහි ශිෂ්‍යයන්ට සහ සේවකයන්ට ප්‍රධාන ආහාර ද්‍රව්‍ය, අතුරුපස, තේ හා සිසිල් පැන් ආදිය පිළියෙළ කිරීම හා සැපයීම සඳහා පමණක් පාවිච්චි කිරීමට ආහාරපාන සැපයුම්කරු බැඳී සිටී.

ii. එකී ආපනශාලා භූමිය හා ගොඩනැගිලි ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් ආහාර සැපයුම්කරුවන්ගෙන් කුලියක් අය නොකරන අතර පාවිච්චි කරන විදුලිය හා ජලය සඳහා අදාළ ගාස්තුත් ගෙවිය යුතුය. මීට අමතරව වෙනත් කිසිදු පහසුකමක් ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් ආපනශාලා හිමිකරු වෙත සපයනු නොලැබේ.

iii. සතියේ සෑම සෙනසුරාදා හා ඉරිදා දිනයන්හි වෙළඳ කටයුතු සදහා පෙ.ව. 6.00 සිට ප.ව. 6.00 දක්වා ආපනශාලාව ආහාරපාන සැපයුම්කරු විසින් විවෘතව තැබිය යුතුය. විශේෂ අවශ්‍යතාවයන්හි දි ලේඛකාධිකාරීගේ ඉල්ලීම මත දීර්ඝ වේලාවක් හෝ විවෘතව තැබීමට කොන්ත්‍රාත්කරු එකග විය යුතුය.

iv. ටෙන්ඩර් මගින් ගිවිස ගත් ප්‍රමාණයන්හට හා මිළ ගණන් වලට අනුව ප්‍රධාන ආහාර ද්‍රව්‍ය අතුරුපස තේ හා සිසිල් පැන් විකිණීමට ආහාරපාන සැපයුම්කරු කටයුතු කල යුතුය. අනුමත කරන ලද මිළ ගණන් ප්‍රදර්ශනය කිරීම අනිවාර්ය වේ.

v. ලේඛකාධිකාරී විසින් නිසි පරිදි බලය පවරනු ලැබූ නිළධාරින්ට එකී ආපනශාලා භූමියට හා ගොඩනැගිලි භූමියට ඇතුළුවී එකී තත්වය පරීක්ෂා කිරීමට ආහාරපාන සැපයුම්කරු ඉඩ දිය යුතුය.

vi. අවශ්‍ය අවස්ථාවන්හි දී එකි ආපනශාලා භූමියට හා ගොඩනැගිලි භූමියට ඇතුළු වී එහි සෞඛ්‍ය තත්ත්වය සනීපාරක්ෂක විධිවිධාන ආහාර ද්‍රව්‍ය සේවාවන් හා ඊට සම්බන්ධ සියලු කටයුතු පරීක්ෂා කර බැලීමට ඉඩ දිය යුතු අතර සපයනු ලබන ආහාරවල පිරිසිදුකම හා තත්වය විශ්වවිද්‍යාලයීය නිලධාරින්ගේ නියමයන්ට අනුව විය යුතුය.

එසේම කිසිම ආකාරයක දුම්වැටි, මත්ද්‍රව්‍ය, මත්පැන් හා බුලත්විට අලෙවි කිරීමත්, ගබඩා කිරීමත් ආපනශලා භාරකරු හෝ එහි සේවකයින් දුම්වැටි, මත්පැන්, බුලත්විට හා මත්ද්‍රව්‍ය භාවිතා කිරීමත් සම්පූර්ණයෙන්ම තහනම් බව දෙවන පාර්ශවය පිළිගනී. එසේම එවැනි නීතිවිරෝධී කටයුත්තක් කරනු ලබන බව අනාවරණය වූ පළමු අවස්ථාවේදීම ආපනශාලා කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට පළමු පාර්ශවයට බලය ඇති බවත් දෙවන පාර්ශයවය පිලිගනී.

එසේම කිසිදු ආකාරයක විෂමාචාර ක්‍රියාවක් නොකිරීමටත් අනුබල නොදීමටත් කොන්ත්‍රාත්කරු වග බලා ගත යුතුය.

vii. ආපනශාලාවේ කෑම පිලියෙල කිරීමේ කටයුතු උසස් සනීපාරක්ෂක තත්ත්වයන්ට අනුව සිදුකළ යුතු අතර ආපනශාලාවේ පිරිසිදුකම ගැන ආහාරපාන සැපයුම්කරු විශේෂයෙන්ම වගකිව යුතුය.

viii. කිසිදු ද්‍රව්‍යයක් සැපයීම සදහා හෝ ආහාරපාන සැපයීමේ කාර්යයන් පිළිබඳව විශ්වවිද්‍යාලයේ නාමයෙන් වෙනත් පාර්ශවයක් සමග කිසිදු ගිවිසුමකට හෝ කොන්ත්‍රාත්තුවකට අත්සන් කිරීමට කොන්ත්‍රාත්කරුට අවසරයක් නැත.

ix. ආහාරපාන සැපයුම්කරු විසින් එකී ආපනශාලාව සේවාව පිණිස එකී පරිශ්‍රය තුලට ගෙන එනු ලබන ඔහුගේ /ඇයගේ පෞද්ගලික දේපළ පිළිබඳ ලැයිස්තුවක් ආරම්භ කල දින සිට දින හතක් (07) ඇතුලත ලේඛකාධිකාරී වෙත දැනුම් දිය යුතුය.

x. ආහාරපාන සැපයුම්කරු හා ඔහු/ඇය විසින් ආපනශාලා සේවාව සඳහා යොදවනු ලබන පුද්ගලයින් ඉතා විනීත අයුරින් සේවාව ඉටු කළ යුතු අතර එකී ස්ථානයේ සාමයට හා ගෞරවයට බාධාවක් නොවන අයුරින් හැසිරිය යුතුය. එසේම අනුමත සේවකයින් පමණක් සේවයේ යොදවා ගත යුතු අතර පිටස්තර කිසිවෙක් ආපනශාලාවේ නතර කර නොගත යුතුය.

xi. අදාළ ආපනශාලාවේ/ආහාරපාන සැපයුම්කරු විසින් සේවයෙහි යොදවනු ලබන සේවකයින්ගේ විස්තර ඇතුළත් ලැයිස්තුවක් ආහාරපාන සැපයුම්කරු විසින් ආපනශාලා සේවාව ආරම්භ කළ දින සිට දින හතක් (07) ඇතුළත ලේඛකාධිකාරී වෙත ඉදිරිපත් කල යුතුය. එකී ලැයිස්තුවේ වරින් වර සිදුවන වෙනස්කම් ලේඛකාධිකාරී වෙත දැනුම් දිය යුතුය.

xii. ආහාරපාන සැපයුම්කරු යටතේ සේවය කරන්නකු හෝ වෙනත් පුද්ගලයෙකු හදිසි අනතුරකට භාජනය වූ විට හෝ තුවාල ආදිය සිදුවූ කල්හි ඒ වෙනුවෙන් ප්‍රතිකාර කිරීමෙන් හෝ වන්දි ගෙවීමට විශ්වවිද්‍යාලය සම්බන්ධ නොවන අතර එහි වගකීම ආපනශාලා භාරකරු දැරිය යුතුයි. එකී ආහාරපාන සැපයීම පිළිබඳ වෙළඳාම සම්බන්ධයෙන් සිදුවන සියළුම ණයතුරුස් හා සේවක වැටුප් ගෙවීම් ආදිය ආහාරපාන සැපයුම්කරු විසින් ගෙවිය යුතුය. එකී ආහාරපාන සැපයීම පිළිබඳ වෙළඳාම සම්බන්ධයෙන් සිදුවන සියළුම ණයතුරුස් හා සේවක වැටුප් ගෙවීම් ආදිය ආහාරපාන සැපයුම්කරුවන් විසින් ගෙවිය යුතුය.

xiii ආහාර පිසීමේ කටයුතු වලදී පවිත්‍රතාවය හා සනීපාරක්ෂක ක්‍රම ගැන විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය.

xiv. ආහාරපාන සැපයුම්කරු විසින් එකී ආපනශාලාවේ හා ඊට අයත් පරිශ්‍රයෙහි ඇති විදුලි සවිකිරීම් හා මේස පුටු ඇතුළු සියළුම චංචල හා නිශ්චල දේපළ මනා ලෙසත් නිසියාකාරවත් පරිහරණය කළ යුතු අතර ඒවාට කිසිදු හානියක් නොකළ යුතුය. ආපනශාලාවේ දැනට තිබෙන විදුලි සවිකිරීම් හෝ ජල සැපයීම වෙනස් කිරීම හෝ නවතා දැමීම නොකළ යුතුය.

xv. ශිෂ්‍ය ආපනශාලාව පවත්වාගෙන යාමේදී ඍජුව නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, බුලංකුලම දිසා මාවත, II පියවර, අනුරාධපුර උපදෙස් ලබා ගත යුතුය.

xvi. දෙපාර්ශවයෙන් කිනම් පාර්ශවයකට හෝ ලේඛනගත තැපෑලෙන් දෙමසකට කල් දීමක් කිරීමෙන් මෙම ගිවිසුම අවලංගු කළ හැකි වේ.

xvii. එසේ දෙපාර්ශවයෙන් කිනම් පාර්ශවයක් විසින් හෝ මෙම ගිවිසුම අවලංගු කරන්නට යෙදුනහොත් ආහාරපාන සැපයුම්කරුගේ භාරයට පත්කරන ලද එකී භූමියට හා පරිශ්‍රයට හා ඊට අයත් භාණ්ඩ වට්ටෝරුවෙන් අන්තර්ගත සියළුම භාණ්ඩ හා උපකරණවල කිසිදු හානියක් නොකර එම භූමියෙන් ඉවත් වී සාමකාමීව එහි අයිතිය ලේඛකාධිකාරී වෙත භාරදීමට ආහාරපාන සැපයුම්කරු බැඳී සිටී. යම්කිසි අයුරකින් එකී ආපනශාලාවේ භූමියට පරිශ්‍රයට හා ගොඩනැගිල්ලට හා ඊට අයත් සියලු චංචල හා නිශ්චල දේපළ වලට හා භාණ්ඩ වලට හා උපකරණවලට ආහාරපාන සැපයුම්කරු විසින් ඔහු විසින් සේවයෙහි යොදවනු ලබන අය විසින් අලාභහානියක් සිදුකලහොත් හෝ එහි වටිනාකම හා විදුලි ගාස්තු අයවීමට ඇතොත් ඒවායේ වටිනාකම ආහාරපාන සැපයුම්කරුගේ ඇප මුදලින් අඩුකර ගැනීමට ආහාරපාන සැපයුම්කරු එකඟ වේ. ඒවායේ සම්පූර්ණ වටිනාකම අයකර ගැනීමට ඇප මුදල ප්‍රමාණවත් නොවේ නම් ඒවායේ අලාභය හෝ සම්පූර්ණ වටිනාකම අයකර ගැනීම සඳහා නීති මගින් කටයුතු කිරීමට ලේඛකාධිකාරීට බලය තිබේ.

xviii. * තමා භාරයේ ඇති විශ්වවිද්‍යාලයේ දේපළවලට යම්කිසි අලාභහානියක් සිදු වුවහොත්

* යම්කිසි චෝදනාවකට ආහාරපාන සැපයුම්කරු වරදකරු හැටියට ඔප්පු වුවහොත්

* ආහාරපාන සැපයුම්කරු විසින් ඉහත සඳහන් ප්‍රකාර තමා බැඳී සිටින කොන්දේසි හා නීතිරීති උල්ලංඝනය කළහොත්

එකී අලාභහානියේ වටිනාකම ආහාරපාන සැපයුම්කරුගෙන් අයකර ගැනීමට ලේඛකාධිකාරීට බලය ඇති බව දෙවන පාර්ශවය පිලිගනී. එසේම ආහාරපාන සැපයුම්කරුට ලිඛිත කල්දීමකින් අනතුරුව ආපනශාලා භාරකරු ඉවත් කිරීමටද ලේඛකාධිකාරීට බලය ඇත.

xix. මෙම ගිවිසුම කලින් අවලංගු කරන්නට යෙදුන විටදී හෝ නියමිත කාලය අවසන් වීමෙන් අනතුරුව හෝ එකී ආපනශාලා භූමියට හා පරිශ්‍රයට හා ගොඩනැගිලි වලට අනවසරයෙන් ඇතුලුවීම හෝ හානි සිදුකිරීම දෙවන පාර්ශවය විසින් සිදු නොකල යුතුය. එසේම ගිවිසුම අවලංගු කිරීමට සිදුවන **අවස්ථාවේදී එකී ආපනශාලා** භූමියට **හා පරිශ්‍රයට ඇතුලු වී එහි දොර ජනෙල් ගේට්ටුව යනාදිය විවෘත කල හැකිය.**

xx. මෙහි කිනම් පාර්ශවයකින් හෝ මෙම ගිවිසුම අවසන් කරන්නට යෙදුනේ වී නමුත් එයින් ගිවිසුම අවසන් කරන දින දක්වා එකී ආපනශාලා සැපයුම්කරුගෙන් අයවන්නට තිබෙන මුදලක් හෝ මෙම ගිවිසුමේ කොන්දේසි හා නීතිරීති කඩ කිරීම් නිසා පනවන ලද මුදලක් හෝ අලාභහානි හෝ ඌණතා පිළිබඳව අයකර ගැනීමට හෝ ලේඛකාධිකාරීට ඇති අයිතිය එසේම පවතී.

xxi. තෝරාගත් කොන්ත්‍රාත්කරු තෝරාගත් බවට දැන්වීමෙන් සති 02 ක් ඇතුලත විශ්වවිද්‍යාලය සමඟ ගිවිසුමකට එළඹිය යුතුය. ගිවිසුමට එළැඹීමෙන් පසුව ඒ සඳහා ආපනශාලා ඇප මුදල රු. 50,000/- ක මුදලක් හෝ බැංකු සුරැකුම්පතක් විශ්වවිද්‍යාලයට ලබාදිය යුතුය.

13. ටෙන්ඩර් එවනු ලබන කවරයේ ඉහල වම් කෙළවර දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ ආපනශාලාව යනුවෙන් පැහැදිලිව ලියා තිබිය යුතු අතර ටෙන්ඩර් බහා එවන කවරෙයේ සීල් තිබිය යුතුය. ඔබගේ පලපුරුද්ද සනාථ කිරීම සඳහා පසුගිය වර්ෂවල ආපනශාලා පවත්වාගෙන ගිය බවට ලිඛිත සාක්ෂි අමුණා එවිය යුතුය.

14. සියළුම ටෙන්ඩර් 2024.10.23 දින ප.ව. 2.15 නියෝජ්‍ය ලේඛකාධිකාරී, දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානය, බුලංකුලම දිසා මාවත, ii පියවර, අනුරාධපුර කාර්යාලයේදී විවෘත කරනු ලැබේ. කිසියම් ටෙන්ඩරයක් පිළිබඳ ටෙන්ඩර්කරුගේ හැකියාව හෝ ඔහු සතු සම්පත් පිළිබඳ මතුවිය හැකි කරුණු පිළිබඳ පැහැදිලි කිරීමට ටෙන්ඩර්කරු හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයෙක් ටෙන්ඩර් විවෘත කිරීමේ දී සිටිය යුතු බවට උපදෙස් දෙනු ලැබේ.

15. ආපනශාලාවේ සේවයේ යෙදී සිටින සියලුම සේවකයන් ආපනශාලාවට පැමිණෙන සිසුන්ට හා කාර්යය මණ්ඩලයට ප්‍රියමනාප ලෙස ආමන්ත්‍රණය කල යුතුය. නේවාසික සිසුන්ට හා කාර්යය මණ්ඩලයට අසභ්‍ය වචන වලින් බැන වැදීම වැනි ක්‍රියා නොකල යුතුය.

16. ඉහත සඳහන් කොන්දේසි පිළිබඳ අතිරේක පැහැදිලි කිරීමක් අවශ්‍ය වන්නේ නම් ඒ පිළිබඳ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යයන මධ්‍යස්ථානයේ නියෝජ්‍ය ලේඛකාධිකාරී හමුවිය හැකිය.

17. සියළුම ටෙන්ඩර්පත් සමග අත්සන් කරන ලද මෙම කොන්දේසි මාලාවේ පිටපතක් ටෙන්ඩර්කරු විසින් ඉදිරිපත් කළ යුතුය.

18. තමන් වෙත විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කර ඇති ටෙන්ඩරය කිසිම අවස්ථාවකදී ආපනශාලාව පවත්වාගෙන යාම සඳහා වෙනත් පුද්ගලයකුට හෝ වෙනත් ආයතනයකට අතුරු බද්දකට දීමට දෙවන පාර්ශවකරුට කිසියම්ම ආකාරයක බලයක් හෝ අයිතියක් නොමැති අතර එසේ අතුරු බද්දකට දී ඇති බව අනාවරණය වුවහොත් ටෙන්ඩරය අවලංගු කිරීමටත්, තැන්පතු මුදල විශ්වවිද්‍යාලයීය සතු කිරීමටත්, කොන්ත්‍රාත්කරු අසාදු ලේඛණගත කිරීමටත් (Black List) විශ්වවිද්‍යාලය කටයුතු කරනු ලැබේ.එමෙන්ම ආපනශාලාව කරගෙන යාමට අපහසු නම් ඒ බව දැනුම් දී ගිවිසුම අවලංගු කර ගැනීමට දෙවන පාර්ශවය ක්‍රියා කරන බවට එකඟ විය යුතුය.

19. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1980 අංක 26 දරණ ආහාර පනතේ විධි විධාන පරිදි ආපනශාලාව පවත්වා ගෙන යාමට කටයුතු කිරීමට දෙවන පාර්ශවය බැඳී සිටී.

ලේඛකාධිකාරී
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
2024.10.02